# පාසල් නොයා විභාග කලින්ම ලියා වෙනස් අනාගතයකට යන අයියයි මල්ලියි



නොලස්කො, නිකොලායි පියා සමග

ලංකාවේ තිබෙන විභාග ක්‍රමය අනුව වයස අවුරුදු දහයක දරුවකු මුහුණ දෙන්නේ පහවසර ශිෂ්‍යත්වයටයි. ශිෂ්‍යත්ව විභාගයට වාඩිවන වයසේ සිටින නමුත්, අ.පො.ස. සා/පෙළ විභගය හා සමාන විභාගයකට මුහුණ දී ඉන් සමත් වූ දරුවකු පසුගියද අපට හමුවිය. එලෙස වයස අවුරුදු දහයේ දී බ්‍රිතාන්‍ය කවුන්සලය පවත්වනු ලබන එඩෙක්ස්සෙල් (Edexcel international GCSE) විභාගයට වාඩිවී එය ඉහළින්ම සමත්ව ඇත්තේ දෙරන් නොලස්කො ද සිල්වා ය. ඔහු වාණිජ, ව්‍යාපාර අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, ගණිතය, සිංහල සහ ඉංග්‍රීසි භාෂාව යන විෂයන්වලින් විභාගයට මුහුණ දුන්නේය. ඒ, මීට අවුරුදු පහකට පෙරය. ඔහු වයස අවුරුදු දෙළහේ දී අ.පො.ස. උසස් පෙළ විභාගයට මුහුණ දුන්නේය. ඒ, 2023 දී වාණිජ විෂය ධාරාව යටතේය. ඔහු ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යනය සහ ගිණුම්කරණය යන විෂයන් සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටි අතර එම විෂයන් තුන සඳහා එස් සාමාර්ථ තුනක් ලබා ගැනීමට හැකිවිය. දැන් ඔහුගේ වයස අවුරුදු 14කි.

'මම තුන වසර වෙනකන් ඉස්කෝලෙ ගියා. කොවිඩ්වලට ඉස්කෝලේ වහලා නැවත විවෘත කළාට පස්සේ ඉස්කෝලෙ යන එක නතර කළා. මම ඉස්කෝලේ ගියේ වත්තල සෙන් ඇන්තනිස් එකට. ගෙදර ඉඳලා ඉගෙන ගත්ත එක මට හරිම වටිනවා. මම හිරවෙලා වැඩ කළේ නැහැ. පහ වසර ඉන්න ළමයෙක් කරන්න ඕන සෙල්ලම් ඔක්කොම මාත් කළා. කාලසටහනකට වැඩ කළා. උදේ අටේ වගේ ඉඳලා දවල් දෙළහ වෙනකන් ඉස්කෝලේ වැඩ කළා. එතනින් පස්සේ ඉතින් නිදහස්. කිසි වැඩක් කළේ නැහැ. හොඳට සෙල්ලම් කළා. කාටූන් බැලුවා. මේ හැමදේම කළා. ඇති වෙනකන් ක්‍රිකට් මැච් බැලුවා. අවුරුදු දහයෙන් ඕලෙවල් ලිව්වා කියලා මට එහෙම බයක් නම් දැනුණේ නැහැ. සැහැල්ලුවෙන් ගිහින් ලියලා ආවා.

ඒලෙවල් ලියද්දි මට අවුරුදු දෙළහයි. ඒ කාලේ විභාගේ ලියපු පොඩිම ළමයා මමයි. අනිත් ඔක්කොම ලොකු අය. ඒලෙවල්වල එකවුන්ට් පේපර් එක ලියද්දි මට පොඩි ප්‍රශ්නයක් ඇතිවුණා. මම අරගෙන ගියේ සයින්ටිෆික් කැල්කියුලේටර් එක, නමුත් විභාග ශාලාවේ හිටිය නිලධාරියා මට කිව්වා ඒක දෙන්න බැහැ. නමුත් ඒ වසරේ ඕන තරම් එම කැල්කියුලේටරේ පාවිච්චි කරලා තිබ්බා විභාග මධ්‍යස්ථානවල. ඒ පීඩනය නම් මට හොඳටම දැනුණා. මොකද හදිස්සියට තව කෙනෙක්ගෙන් ඉල්ලගෙන ගාණ හදනවා ආපහු දෙනවා. බාගෙට තමයි ඔක්කොම කරගන්න පුළුවන් වුණේ. මට හිතුනා ෆේල් වෙයිද කියලත්. නමුත් මට එස් එකක් තිබුණා.'

මල්ලීට කලින් මේ හපන්කම කළේ අයියා ය. ඔහු නමින් තීක්ෂණ නිකොලායි ද සිල්වා ය. ඔහු ද පාසල් ගමන අතහරිමින් නිවසේ සිටම විභාගයට මුහුණ දීමට තීරණය කළේ කොරෝනා කාලයේදීමය. ඔහුත් පෙනී සිටියේ බ්‍රිතාන්‍ය කවුන්සලය විසින් පවත්වනු ලබන එඩෙක්ස්සෙල් (Edexcel international GCSE) විභාගයටය. ඔහු ද එයට පෙනී සිටියේ මල්ලී පෙනී සිටි විෂයන්වලින්මය. ඔහු ද එය සමත් වූවේය.

'මම තමයි මුලින්ම ඕලෙවල් කරන්න ලෑස්ති වුණේ. කොවිඩ්වලට රට වහද්දී මම හිටියේ අට වසරේ. මම ඒ වෙනකොටත් ලන්ඩන් ඕලෙවල්වලට ලෑස්ති වෙමින් සිටියේ. ඒ කාලේ මම විෂයන් පහළොවක් ඉගෙන ගන්නවා. ඒ ඉස්කෝලේ විෂයයන් නවයයි ලන්ඩන් ඕලෙවල් විෂයන් හයයි. ලන්ඩන් ඕලෙවල්වල එකවුන්ට් විෂයන් ඔක්කොම ඉගැන්වුවේ තාත්තා. ඒ වෙනකොට තාත්තා ජාත්‍යන්තර පාසලක ඒ විෂය උගන්නමින් හිටියේ. නමුත් තාත්තාට ගණිතය කියලා දෙන්න අපහසු වුණා. ඒ සඳහා ගුරුවරයෙක් ගෙදරට ගෙන්නුවා. තාත්තා ඒ ගුරුවරයා ගෙන්නනකොට මට කිව්වේ පුතේ ඔයා හොඳට ඉගෙන ගන්න මොකද ඔයාට තමයි මල්ලිටත් ගණන් උගන්නන්න වෙන්නේ කියලා. ඒ කිව්වා වගේම ලන්ඩන් ඕලෙවල්වලට මම තමයි මල්ලිට ගණන් ඉගැන්නුවේ. තාත්තා අපි දෙන්නම ඉස්කෝලෙන් ඉවත්කර ගත්තා. මම රජයේ ඕලෙවල් අතඇරියා. මම වයස දහතුනේ දී ලන්ඩන් ඕලෙවල් කළා. ඊට පස්සේ ගවර්මන්ට් ඒලෙවල් කළා. ඒ ආර්ථික විද්‍යාව, ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයන් ඉංග්‍රීසි මාධ්‍යය යටතේ.'

අයියා වයස අවුරුදු දහතරේ දී අපොස උසස් පෙළ විභාගයට මුහුණ දුන්නේය. මල්ලී එයට පෙනීසිටියේ වයස අවුරුදු දෙළහෙදීය. ඔවුන් කියනා ආකාරයට එය එතරම් අපහසු නොවූයේ එඩෙක්සෙල් විභාගය නිසාය.

'අපි දෙන්නාට ලන්ඩන් ඕලෙවල්වල දී රජයේ ඒලෙවල් විභාගයේ වාණිජ විෂය මාලාවේ අඩිතාලම වැටිලා තිබුණේ. ඒලෙවල්වලට ඉගෙන ගන්න තිබ්බේ තවත් ටිකයි. තාත්තා මේ විෂයන් උගන්වන නිසා අපිට බයක් තිබුණේ නැහැ. ඔහු හැමදේම කියලා දුන්නා. අපිට හැම තිස්සෙම කිව්වේ 'ඒ' ගන්න 'බී' ගන්න කියලා නෙවෙයි විභාගේ පාස් වෙන්න කියලා විතරයි. අපි දෙන්න ඒ දේ කළා.'

මේ දරුවන්ගේ තාත්තා ලසන්ත ද සිල්වාය. පෙර සඳහන් කළ පරිදි ඔහු ගුරුවරයෙකි. එසේම ඔහු ලේඛකයෙකි. ඔහුට අවශ්‍ය වී ඇත්තේ දරුවන් නිදහසේ ඉගෙන ගනිමින් ඔවුන් කැමැති මාවතක ගමන් කරනු දැකීමය.

'ළමයි දෙන්නයි මායි විභාග කියලා නැහැ. විභාගෙ හෙට තිබ්බත් මැච් එකක් තිබ්බොත් අනිවාර්යයෙන්ම ක්‍රිකට් මැච් එක බැලුවා. කොච්චර පරදිනවා කිව්වත් අපි තුන්දෙනා ක්‍රිකට් මැච් නම් බලනවා. එහෙම තමයි මේ අය හැමදම විභාග ලිව්වේ. කොවිඩ්වලට රට වහද්දි එක ෆෝන් එකයි අපි ළඟ තිබුණේ. මමත් ගුරුවරයෙක් හින්ද මටත් ඔන් ලයින් ක්ලාස් තිබ්බා. අපි මැනේජ් කරගෙන කොහොම හරි එක ෆෝන් එකෙන් තමයි මේ කාලේ ඉගෙනගැනීම් කළේ. මම හැමතිස්සෙම දරුවන්ට කිව්වෙ විභාගෙට මුහුණ දීලා පාස් වෙන්න කියන එක විතරයි. මම කොයි වෙලාවත් මේගොල්ලන්ට කිව්වේ නෑ 'ඒ' ගන්න 'බී' ගන්න කියලා. මට අවශ්‍ය වුණේ විභාගේ පාස් වීම පමණයි.'

නිවසේ සිට ඉගෙන ගැනීම සමාජය මගහැරීමක් ලෙස ඇතැමකුට සිතෙන්නට පුළුවන. යාළුවෙක් මුණ නොගැසී සමාජ ආශ්‍රයක් නොමැති වීම පාසල් නොයා නිවසේ සිට අධ්‍යාපනය ලබන දරුවකුට සිදුවන ලොකුම බලපෑම යැයි අපට සිතේ. නමුත් මෙම දරුවන් සමග කළ කතාබහේදී නම් කිසිම කෝල බවක් ඔවුන්ගෙන් නොදුටුවේය. පාසල් යන දරුවන්ට නොදෙවෙනි සමාජශීලී බවක් ඔවුන්ගෙන් දුටුවේය.

'පාසල් ගියේ නෑ කියලා යාළුවො මගහැරීමක් සිද්ධ වුණේ නැහැ. අපේ අහල පහල යාළුවෝ හිටියා, පවුලේ යාළුවෝ හිටියා. ඒක හින්ද යාළුවොත් එක්ක ගනුදෙනුව හොඳටම තිබුණා.'

දරුවන් කියන්නේය.

'දරුවන්ට ඒලෙවල් කරන්න කිව්වේ වෙනම ක්ෂේත්‍රයකට යවන්න ඕන හින්දම නෙමෙයි. මේගොල්ලන්ට ඉදිරියට යන්න යම්කිසි සහතිකයක් අවශ්‍ය වෙන නිසා. ඉක්මනට ඒලෙවල් කළේ මටත් ඕන වුණා ඉක්මනට මේගොල්ලෝ ඉස්කෝලේ ගිහින් ඉවර කරන්න. මොකද මේ දැන් තියෙන ක්‍රමේ අනුව විශාල කාලයක් ඉස්කෝලෙ යන එක අවශ්‍ය නෑ කියලා මට තේරුණා. අධ්‍යාපනය පැත්තෙන් මාස්ටර්ස් එකක් මම ප්ලෑන් කරලා තිබුණේ. ලොකු පුතා පෞද්ගලික ආයතනයක ඒ සඳහා ලියාපදිංචි වුණා, ඩිග්‍රි එක කරන්න. නමුත් විභාගේ දවසේ මෙයාට විභාගෙ ලියන්න දුන්නේ නෑ. මොකද මෙයා කොණ්ඩේ වවලා හිටියේ. මම ඒ ආයතනයට ඇතුල් වෙද්දිම කිව්වා මෙයා කොණ්ඩෙ වවන එක ප්‍රශ්නයක් නෑ නේද කියලා. ඒ ප්‍රශ්නය ඒ අයගෙන් අහලා තමයි එතෙන්ට ඇතුළත් කළේ. නමුත් විභාග දවසේ ලොකු පුතා කොණ්ඩේ වවලා කියලා ලොකුවට කරදර කළා. කොහොම හරි විභාගෙ ලිව්වා.'

මේ පුතුන් දැන් ඔවුනට උරුම මගෙහි ගමන් කරමින් සිටිති.

'ඊට පස්සෙ ලොකු පුතා තීරණය කළා ඇස්ට්‍රොනොමි ඉගෙන ගන්නවා කියලා. එයා ඒක තනියම ඉගෙන ගන්න පටන් ගත්තා. කවදහරි ලෝකෙ ජය ගන්න තැනට යන්න තමයි එයාට අවශ්‍ය.මම පුස්තකාලයට යන්න පටන් ගත්ත දවස ඉඳලම ලොකු පුතා ඇස්ට්‍රොනොමි සම්බන්ධව පොතපත කියවනවා.'

තාත්තා සමග කතාබහ අතරතුර ලොකු පුතා ද මෙයට යමක් එක් කළේය.

'පුස්තකාලයේ මට කියවන්න ඇස්ට්‍රොනොමි පොත් තවත් නැහැ. තවත් ඒ සම්බන්ධ පොතපත හොයනවා. සාමාන්‍ය දේවල් ගැන පොත පත කියවනවට වඩා මම අභ්‍යවකාශ විද්‍යාව ගැන කියවන්න තමයි ආස.'

පොඩි පුතා ද ඔහුගේ කියවීම පිළිබඳ යමක් එක් කළේය.

'මම වැඩිපුරම ආස වලස් කතා කියවන්න. මමත් පුස්තකාලෙ තියෙන හැම වලස් කතාවක්ම කියවලා ඉවරයි මේ වෙනකොට. මම ඉස්සරහට යන්න තෝරගත්තේ සංගීතේ. ඒක මටම අනන්‍ය වූ සංගීතයක් විදිහට ඉදිරියට යන්න තමයි ආස. මම ආසයි ලෝකෙ ඉන්න හොඳම 'යුකුලීලෙ' (ukulele) වයන අයගෙන් එක්කෙනෙක් වෙන්න.'

ඔහු වාදනය කරන සංගීත භාණ්ඩය සේම එම සංගීත භාණ්ඩයේ නමත් අපට නුහුරුය. ඒ නිසාම දරුවන්ගේ පියා අපට ඒ ගැන පැහැදිලි කළේය.

'මගේ යාළුවෙක් තමයි මේ යුකලීනය පුතාට ගෙනත් දුන්නේ. ඒක මෙයා තනියම වාදනය කරන්න පටන් ගත්තා. යූටියුබ් එකෙන් තමයි ඉගෙන ගත්තේ.මේක දකින හැමෝම හිතන්නේ මේක සෙල්ලම් ගිටාරයක් කියලා. නමුත් මේක සෙල්ලම් ගිටාරයක් නෙමෙයි. මේක සංගීත භාණ්ඩයක්.'

ඔවුන්ගෙන් සමුගෙන එන මොහොතේ අපට දැනුනේ නිදහස් ජීවිතයක් සහ වෙනස් අනාගතයක් දකින පියෙක් සහ පුතුන් දෙදෙනෙක්ය.

ශිරෝමි රත්නායක
ඡායාරූපය - ක්‍රිෂාන් කාරියවසම්